විසර්ජන ශිර්ෂය 126- අධ්‍යාපන අමාත්‍යාංශය
-----------------------------------------------

1. **මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන්**
---------------------------------

(අ) **මෙහෙවර**
----------

පාර්ශවකරුවන් තෘප්තිමත් භාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද හා නූතන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහි කිරීම.

(ආ) **ප්‍රධාන කාර්යයන්**
------------------

(i) අධ්‍යාපන අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
(ii) සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ගුණාත්මක ප්‍රමිතීන් නිර්ණය කිරීම හා පවත්වා ගෙන යාම.
(iii) විෂය මාලා සංවර්ධනය කිරීම හා ඇගයීම.
(iv) අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධව පර්යේෂණයන් හා අධ්‍යයනයන් කිරීම.
(v) වැඩ සටහන් හා ව්‍යාපෘතීන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම.
(vi) මානව සම්පත් සංවර්ධනය.
(vii) සාමාන්‍ය අධ්‍යාපනයේ සංවර්ධනය උදෙසා ද්විපාර්ශවික හා බහුපාර්ශවික වශයෙන් විදේශීය සම්බන්ධතා පවත්වා ගෙන යාම.
(viii) විභාග කටයුතු ඇගයීම.

2. **ගිණුම් ඉදිරිපත් කිරීම**
----------------------

අමාත්‍යාංශය විසින් පිළියෙල කරනු ලබන ගිණුම් සහ ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| ගිණුමේ නම | ගිණුම් අංකය | 2010 අප්‍රේල් 30 දිනට ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම |
|---|---|---|
| විසර්ජන ගිණුම | 126 | ඉදිරිපත් කර ඇත |
| රජයේ නලධාරීන්ට අත්තිකාරම් ගිණුම | 12601 | ඉදිරිපත් කර නැත |

3. **ගිණුම්**
-------

3.1 **විසර්ජන ගිණුම**
------------------

ශිර්ෂය : 126
---------------

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**
-----------------------------

| වියදමේ ස්වභාවය | වාර්ෂික මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන | සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය * | තථ්‍ය වියදම (2009.12.31 දිනට) | ඉතිරිය (2009.12.31 දිනට) |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන | 21,166,132,000 | 21,818,845,000 | 21,511,613,873 | 307,231,127 |
| මුලධන | 4,503,550,000 | 4,397,017,000 | 3,753,262,672 | 643,754,328 |
| **එකතුව** | **25,669,682,000** | **26,215,862,000** | **25,264,876,545** | **950,985,455** |

*අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර අවුරා තබන ලද ප්‍රතිපාදනය, පර්පූරක ප්‍රතිපාදන හා පර්පූරක ඇස්තමේන්තු වෙන් කිරීම්, මු.රෙ.66 හා 69 අනුව මාරු කිරීම් සඳහා ගැලපුම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය

**(ආ) ප්‍රතිපාදන උපයෝජනය**

* සමාලෝචිත වර්ෂයට අදාලව පහත සඳහන් පරිදි ප්‍රතිපාදනයන්හි උපයෝජනයන් වාර්තා විය.

| | ප්‍රතිශතය |
|---|---|
| - මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය | 96.37 |
| - මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස වැයකිරීම් ප්‍රමාණය | 85.35 |

* වැය විෂයයන් 58 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.160,471,716 ක්වූ සම්පූර්ණ පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

* වැය විෂයයන් 90 කට අදාලව මුල් ප්‍රතිපාදනයෙන් 50% කට වැඩියෙන් එනම් රු.1,591,659,074 ක් ඉතිරිකර තිබුණි.

## 3.2 අත්තිකාරම් ගිණුම්

### 3.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගණුම

**(අ)** ගිණුම් ඉදිරිපත් නොකිරීම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළයුතු අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම 2010 මැයි 31 දින වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉකුත් වර්ෂයට අදාල අත්තිකාරම් ගිණුම 2009 සැප්තැම්බර් 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(ආ) හිඟ හිටි ණය ශේෂ (2008.12.31 දිනට )

(i) 2008 දෙසැම්බර් 31 දිනට පහත පරිදි රු.237,623,839 ක්වූ ණය ශේෂයක් අයවීම් හිඟහිට තිබුණු අතර එම හිඟහිටි ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක්ද ඉදරිපත් කර නොතිබුණි.

| විස්තරය | හිඟ හිටි මුදල රු. |
|---|---|
| (i) සේවා ස්ථාන මාරුවීම් | 206,603,038 |
| (ii) විශ්‍රාම යාම් හා මිය යාම් | 20,731,241 |
| (iii) සේවය අතහැර යාම් /වැඩ තහනමට ලක්වීම් | 8,914,538 |
| (iv) සේවයෙන් මුදා හල හා විදේශ ගත වූ | 1,375,022 |
| එකතුව | 237,623,839 |

(ii) වර්ෂ ගණනාවක සිට පැවත එන රු.60,576,495 ක්වූ ගිණුම් දෝෂ 2008 දෙසැම්බර් 31 දින වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) කේවල ගිණුම් ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.113,297 ක වෙනසක් පැවතුණි.

(iv) දකුණු පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සැසඳුම් ප්‍රකාශය අනුව නොසැසඳු ශේෂය රු.269,017 ක් විය.

(v) පලාත් සභාවලට පැවරිය යුතු වුවත් එසේ පවරා නොතිබූ මුළු ණය ශේෂවල එකතුව රු.6,227,533 ක් විය.

(vi) අමාත්‍යාංශය විසින් පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවකට හා විද්‍යාපීඨ 9 කට ලබාදුන් ප්‍රතිපාදන වලින් 40% ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

3.3 **අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

-----------------------------------

(අ) **අග්‍රිම ගිණුම**

-------------

2009 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙ රු.21,132,765 ක්වූ අග්‍රිම බැර ශේෂයක් තිබුණි. එම ශේෂය 2010 අප්‍රේල් 30 දින වන විටද පියවා නොතිබුණ.

(ආ) **පොදු තැන්පත් ගිණුම**

-----------------------

2009 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් 10 කට අදාලව රු.537,983,055 ක ශේෂයක් පැවතුණි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එම ශේෂයන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) විගණනයට අනාවරණය වු පරිදි ඉහත ශේෂය තුළ මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන පරිදි කටයුතු කළ හැකිව තිබුණු නමුත් එසේ කටයුතු නොකළ වර්ෂ 2 කට වැඩි කාල සීමාවක සිට පැවති තැන්පත් ශේෂවල එකතුව රු. 14,646,421 ක් විය.

(iii) මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම් ශේෂ භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පොදු තැන්පත් ගිණුම් තුනකට අදාලව අමාත්‍යාංශය හා භාණ්ඩාගාර පොත් අනුව රු.146,749,017 ක වෙනසක් පැවතිණ. මෙම වෙනස සැසඳීමෙන් තොරව භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අමාත්‍යාංශ පොත්වල ඉදිරියට ගෙනවිත් තිබුණි.

4. **වත්කම් කළමනාකරණය**

--------------------------

(අ) **නිශ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්**

--------------------------------------

(i) දීර්ඝ කාලීන සැලසුම් වලින් තොරව විෂයය මාලා හඳුන්වාදීම, කලින් කල සංශෝධන කිරීම හා සීමා කිරීම ආදී හේතු නිසා දෘඩ තාක්ෂණවේදය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව (යාන්ත්‍රික හා සිවිල්), පේෂ කර්මාන්තය, ලෝහ වැඩ හා ඉදිකිරීම් තාක්ෂණය වැනි විෂයයන් පාසල් වලින් බැහැර වෙන තත්ත්වයක් උද්ගතව පැවතුණි. මේ හේතුවෙන් එම විෂයයන්වල ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ලබාදී ඇති විශාල වටිනාකමැති භෞතික සම්පත් උපයෝජනයකින් තොරව විනාශ වෙමින් පවතින අවස්ථා විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(ii) කැසට් රෙකෝඩර් 07 ක් මහන මැෂින් දෙකක්, ඉංග්‍රීසි කෙටි කථා පොත් තොගයක්, කෘෂි උපකරණ තොගයක් කොළඹ කලාප අධ්‍යාපන කාර්යාල ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.

(iii) 2009 ජනවාරි සහ ඔක්තෝබර් ලැබී තිබුණු පරිගණක 13 ක් හා 03 ක් 2010 ජූලි 09 දින දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------

මුදල් රෙගුලාසි 756 අනුව අමාත්‍යාංශය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා මු.රෙ.757(4) ප්‍රකාර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2004 - 2009 වර්ෂය දක්වා වු සමීක්ෂණ මණ්ඩල වාර්තා 2010 මැයි දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

5. **අනුකූල නොවීම්**

---

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>ආයතන සංග්‍රහය</u> | |
| (i) vii පරිච්ඡේදයේ 12.5.2 ජේදය | අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ පුරප්පාඩු තනතුරු 08 ක වැඩ බැලීම සඳහා පත්කළ නිලධාරීන් 08 දෙනෙකුට නියමිත විධානවලට පටහැනිව 12.5.4 ජේදය ප්‍රකාරව 1999 වසරේ සිට ගණනය කරන ලද රු.3,786,711 ක් වැඩ බැලීමේ වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |
| (ii) xii පරිච්ඡේදයේ 1.3 ජේදය | කලින් නිවාඩු අනුමත කරවා ගෙන ගුරුභවතුන් නිවාඩු ලබා නොගැනීම හේතුවෙන් පාසල්වල දෛනික ඉගැන්වීමේ ක්‍රියාවලියේ අඩුපාඩු වූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. |
| 13 වන ජේදය | විධිවිධානවලට පරිබාහිරව විශ්ව විද්‍යාලයක බාහිර දේශන පැවැත්වීම සඳහා ගුරුවරයෙකුට දින 70 ක රාජකාරි නිවාඩු 2007 සිට 2009 ජූලි දක්වා අනුමත කර තිබුණි. |
| (iii) xxviii පරිච්ඡේදයේ 1.3 ජේදය | පාසල් සම්බන්ධව සිදුකල විගණනයේදී ගුරුභවතුන් පිටවීම සටහන් නොකර බැහැරවූ අවස්ථා වූ බව නිරීක්ෂණය විය. |
| (ආ) <u>මුදල් රෙගුලාසි</u> | |
| (i) මු.රෙ.66,69 | පාලනයකින් තොරව වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරුකිරීම් සිදු කරනු ලබන බවත් සමාලෝචිත වර්ෂයේ රු.2,005,526,216 ක ප්‍රතිපාදන වැය විෂයයන් 169 ක් සඳහා මාරුකර තිබූ බවත් ඉන් රු.88,948,157 ක් වර්ෂය අවසානයේදී ඉතිරිව තිබූ බවත් නිරීක්ෂණය විය. |
| (ii) මු.රෙ.94(1) | වැය විෂයයන් 10 කට අදාලව ඉතිරිවීම් ඉක්මවා රු.388,738,359 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| (iii) මු.රෙ.1646 | සංචිත වාහනයක් සඳහා ධාවන සටහන් නඩත්තු කර නොතිබූ අතර එම වාහනය සඳහා 2008 හා 2009 වර්ෂවලදී පිළිවෙලින් රු.405,316 ක් හා රු.388,445 ක ඉන්ධන ලබාදී තිබුණි. |
| (ඇ) 2006 මැයි 24 දිනැති අංක 6/2006 හා 2007 අගෝස්තු 24 දිනැති අංක 6/2006(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | කොළඹ අධ්‍යාපන කලාපයේ ගුරුභවතුන් 331 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට රු.මිලියන 23.3 හිඟ පරිවර්ථිත වැටුප් ගෙවීමට සිදුව තිබුණද මෙම ගෙවීම් සඳහා අග්‍රිම නිදහස් කිරීමට අමාත්‍යාංශය කටයුතුකර නොතිබුණි. |
| (ඈ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u> | |
| (i) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන අමාත්‍යාංශය හා ජාතික පාසල්වල නඩත්තු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 2001 ජූලි 02 දිනැති අංක එම්එෆ්/ජ්ඒ2/චක්‍රලේඛ 2001/03 දරන චක්‍රලේඛය | විදේශ පුහුණුව නිමකර දිවයිනට පැමිණි නිලධාරීන් විසින් සති දෙකක් ඇතුලත ඉදිරිපත් කළ යුතු පුහුණුව පිළිබඳ වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සේවක සම්බන්ධතා) වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඉ) <u>අමාත්‍යාංශ චක්‍රලේඛ</u>

| | |
|---|---|
| (i) 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛය | ජාතික පාසල්වල 2-11 ශ්‍රේණිවලට සිසුන් ඇතුලත් කිරීමේදී චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කළ පහත අවස්ථා නිරීක්ෂණය විය.<br>• පාසල් 3 කට සිසුන් 117 ක් ඇතුළත් කිරීම.<br>• ජනප්‍රිය පාසල් 2 කට පන්තියක සිටිය යුතු උපරිම සීමාව ඉක්මවා සිසුන් 50 ක් ඇතුලත් කිරීම. |
| (ii) 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය | නියැදි පරීක්ෂණයට භාජනය කළ පාසල් 22 ක අවුරුදු 10 - අවුරුදු 30 ත් අතර කාලයක් එකම පාසලක සේවය කළ ගුරුභවතුන් 990 ක් වූ බව නිරීක්ෂණය විය. |
| (iii) 2003 නොවැම්බර් 27 දිනැති අංක 2003/28 දරන චක්‍රලේඛය<br><br>21.2 ඡේදය | ගුරුභවතෙකු සතියකට කාලපරිච්ඡේද 33 -35 ක්ද අධීක්ෂණ කටයුතු භාර ගුරුභවතෙකු සතියකට කාලපරිච්ඡේද 18 ක්ද ආවරණය වන ආකාරයට කාල සටහන් සකස් කළ යුතු වුවද පාසල් 4 කට අදාලව සිදු කළ විගණනයේදී ගුරුභවතුන් 63 දෙනෙකු සඳහා කාලපරිච්ඡේද 6-30 ක් වන ආකාරයට කාලසටහන් සකස් කර තිබු බවත් ගුරුභවතුන් 26 දෙනෙකු සඳහා කිසිදු රාජකාරියක් පවරා නොතිබු බවත් නිරීක්ෂණය විය. |
| (iv) 2006 ජුනි 20 දිනැති අංක 2006/27 දරන චක්‍රලේඛය<br><br>8.2.1 හා 8.2.2 ඡේද | පාසල් විසින් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යොමු කරනු ලැබූ ශිෂ්‍යත්වධාරීන්ගේ ශිෂ්‍යාධාරවලට අදාල වවුචර් අදාල මාසයේ 25 දිනට පෙර සිසුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කරනු පිණිස ඒ ඒ බැංකු ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතු වුවද කොළඹ අධ්‍යාපන කලාපයේ 2008 වර්ෂයට අදාල ශිෂ්‍යාධාර මුදල් රු.660,500 ක් හා 2009 වර්ෂයට අදාල රු.3,029,000 ක් අදාල බැංකු වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (v) 2005 සැප්තැම්බර් 30 දිනැති අංක 2005/29 දරන චක්‍රලේඛය | ප්‍රාථමික අංශයේ සිට උසස් පෙළ දක්වා විෂයය ඉගැන්වීමේ මෙවලමක් ලෙස තොරතුරු හා සන්නිවේදන උපකරණ භාවිතය පිළිබඳ මූලික නිපුණතා ලබාදීමට කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (vi) 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය | කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ජාතික පාසල් 19 ක විෂයය සමගාමී ගුරුභවතුන් 451 ක අතිරික්තයක් හා 452 ක හිඟයක් පැවතුණි. |
| (vii) 2002 දෙසැම්බර් 04 දිනැති අධ්‍යාපන ලේකම්ගේ මාර්ගෝපදේශ සංග්‍රහය | ගුණාත්මක යෙදවුම් සඳහා පාසල් 7 ක් වෙත 2008 වර්ෂයේදී ලබාදී තිබුණු මුදලින් රු.600,298 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වනවිටත් උපයෝජනයකින් තොරව බැංකු ගිණුම්වල රඳවාගෙන තිබුණි. |

## 6. විගණනය සඳහා නොලද සාක්ෂි

### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 14 කට සහ ඉකුත් වර්ෂවලදී යවන ලද විගණන විමසුම් 40 කට 2010 අප්‍රේල් 30 දින වනවිටද පිළිතුරු පහත පරිදි ඉදිරිපත් කර නොතිබුණි.

| වර්ෂය | මුළු විමසුම් ගණන | පිළිතුරු නොලත් විමසුම් ගණන |
|---|---|---|
| 2009 | 23 | 14 |
| 2008 | 36 | 23 |
| 2007 හා ඊට පෙර | 48 | 17 |

### (ආ) තොරතුරු ඉදිරිපත් නොකිරීම

සිසුන් සඳහා විශේෂ සේවාවන් සැපයීම යටතේ ශ්‍රවණ ඌනතා හා දෘශ්‍යාබාධ සහිත සිසුන් සඳහා ඇස් කණ්නාඩි හා සවන් වහල් මිලදී ගැනීමට 2008 වර්ෂයේදී රු.මිලියන 1 ක් හා 2009 වර්ෂයේදී රු.මිලියන 1.5 ක් කලාප කාර්යාල වෙත යවා තිබුණද එම මුදල් නිශ්චිතව අදාල කාර්ය සඳහා යෙදවුයේද යනන තහවුරු කර ගැනීමට අදාල ප්‍රභව ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 7. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2009 ක්‍රියාකාර සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

2007 වර්ෂයේ සිට පවත්නා, චිත්‍ර හා සංගීත ගුරු හිඟය පියවා ගැනීම සඳහා කටයුතු කිරීමෙන් තොරව ජාතික පාසලක විදුහල්පතිවරයෙකුගේ නිර්දේශය පදනම් කරගෙන අනධ්‍යයන කාර්ය මණ්ඩල නිළධාරීන් / සේවකයන් අධ්‍යයන කාර්යයවල යොදවා ගැනීමට ජාතික පාසල් අධ්‍යක්ෂවරයා විසින් 2009 වර්ෂයේදී අනුමැතිය ලබාදී තිබුණි. මෙය ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

### (ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ජාතික පාසලක "පාසල් සංවර්ධන සමිති අරමුදල" තරකර ගැනීමේ අරමුණින් පවත්වා තිබු ලොතරැයියක් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රු.20 වටිනාකමැති ටිකට්පත් 100,000 ක් මුද්‍රණය කර ටිකට්පත් අලෙවියෙන් රු.2,000,000 ක ආදායමක් හා රු.1,800,000 ක ලාභයක් අපේක්ෂා කර තිබුණද ඉන් රු.1,205,700 ක ආදායමක් හා රු.1,085,130 ක ලාභයක් පමණක් ලැබී තිබුණි.

නොවිකිණු ටිකට්පත් 19,555 ක් ආපසු භාරදී නොතිබුණු අතර ඒවා ලබාගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඉහත ඉතිරි ශේෂය තුළ ඇතුළත ව තිබූ පාසල් ළමුන්ට ලබාදී තිබු ටිකට් පොත් 187 ක්ද ආපසු භාරදී නොමැති බැව් නිරීක්ෂණය වු හෙයින් දරුවන් අයථා මුදල් පරිහරණයකට වවද යොමු විය හැකි බව නිරීක්ෂණය විය.

### (ඇ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

අමාත්‍යාංශය සිය ප්‍රධාන කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වු අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) වතු පාසල් සිසුන්ගේ 2009 පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා වතු පාසල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 2 ක වියදමක් දරා තිබුණද, කලාප කාර්යාල 7 කින් හා දිස්ත්‍රික්ක 3 කින් ඉදිරිපත් කර තිබුණු ශිෂ්‍යත්ව ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් 96% ක් ශිෂ්‍යත්ව විභාගය අසමත්වී ඇති බවත්, ඉන් 60% කට වැඩි ප්‍රමාණයක් ලකුණු 100 ට අඩුවෙන් ලබාගෙන තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ii) කලාප කාර්යාල 16 කින් හා දිස්ත්‍රික්ක 3 කින් ඉදිරිපත් කරන ලද වතු පාසල්වල 2008 අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් විද්‍යා විෂය 78% ක්ද, ගණිත විෂය 70%ක්ද, ඉංග්‍රීසි විෂය 83%ක්ද අසමත් වී තිබුණු බවද නිරීක්ෂණය විය.

(iii) නව ආදර්ශ ප්‍රාථමික පාසල්වල ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතා පුහුණුව හා හැකියා සංවර්ධන වැඩසටහන් සඳහා 2009 වර්ෂයේ ප්‍රතිපාදනය කර තිබුණු රු.මිලියන 1.5 කින් රු.1,329,750 ක් පළාත් අධ්‍යාපන කාර්යාල 7 ක් වෙත යවා තිබුණු අතර මේ යටතේ පරිගණක පුහුණු වැඩමුළු 10 ක හා හැකියා සංවර්ධන පුහුණු වැඩසටහන් 15 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(iv) පුස්තකාල කාර්ය ක්‍රම පිළිබඳව කිසිදු පලපුරුද්දක් නොමැති සේවකයින් පුස්තකාල කටයුතු සඳහා යොදවාගෙන තිබීම, නිකුත් කරනු ලබන පොත්පත් අප්‍රමාදව ආපසු ලබා ගැනීමේ උපාය මාර්ග සකස් කර නොතිබීම, විද්‍යාලයේ ගුරුභවතුන් විදේශ ගත වීම්, ස්ථාන මාරු වීම හා විශ්‍රාම යන අවස්ථාවලදී පුස්තකාලයෙන් ලබා ගන්නා ලද පොත්පත් නිසිපරිදි ආපසු භාරදී නිදහස්වීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම, එක් සාමාජයෙකුට වරකට පුස්තකාලයෙන් බැහැරදෙන උපරිම පොත් සංඛ්‍යාව පිළිබඳ සීමාවන් පනවා නොතිබීම වැනි හේතු නිසා පාසල් පුස්තකාල පරිපාලන පද්ධතිය ඉතා දුර්වල තත්ත්වයක පැවතිණ. පුස්තකාල සතුව තිබූ විශාල පොත් සංඛ්‍යාවක් ඉහත හේතු මත පුස්තකාල වලට අහිමි වී තිබුණි.

(ඈ) <u>අනාර්ථික ගනුදෙනු</u>

ද්විතීයික අධ්‍යාපනයට අදාල ජීවන නිපුණතා උපක්‍රමික ශිල්ප ක්‍රම පිළිබඳ විදේශීය පුහුණු වැඩසටහනක් සඳහා එම විෂය ක්ෂේත්‍රයට කිසිදු සම්බන්ධතාවයක් නොමැති අමාත්‍යාංශ නිළධාරීන් දෙදෙනෙකු පුහුණු කිරීම සඳහා රු.1,286,997 ක පිරිවැයක් දරා තිබුණි.

## 08. මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2009 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. මාණ්ඩලික | 52 | 46 | 07 | 01 |
| ii.මාණ්ඩලික නොවන | 2,186 | 1,200 | 986 | - |
| iii.කණිෂ්ඨ ශ්‍රේණි | 255 | 240 | 22 | 07 |
| එකතුව | 2,493 | 1,486 | 1,015 | 08 |

සටහන:- අධ්‍යාපන පරිපාලන සේවයට හා ගුරු සේවයට අදාල සේවක සංඛ්‍යා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඉහත තොරතුරුවලට ඇතුළත්ව නොමැත.

**09. අභ්‍යන්තර පාලනය**

**(අ) ලේඛන තබා ගැනීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණ අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 දෙසැම්බර් 28 දිනැති අංක අයිඑඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ. |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි110 |
| වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 |
| වාහන දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ | මුදල් රෙගුලාසි 1646 |
| පහසුකම් හා සේවා ගාස්තු ලේඛනය (ජාතික පාසැල්) | |
| නිවාඩු ලේඛනය (ජාතික පාසැල්) | |

**(ආ) කළමනාකරණ හා විගණන කමිටු ක්‍රියාත්මක කිරීම**

2000 මාර්තු 15 දිනැති අංක පීඑෆ්/පීඊ/7 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් නයමිත පරිදි පවත්වා නොතිබුණි.